ආයුර්වේද වෛද්‍ය සභාව

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරි
තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන **මහරගම, නාවින්න පිහිටි ආයුර්වේද වෛද්‍ය සභාවේ** ඉහත තනතුර සඳහා යෝග්‍ය පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර ස්ථිර සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත තනතුරකි.

බඳවා ගැනීමේ සුදුසුකම් -

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 01 (එකයි)

අධ්‍යාපන සුදුසුකම්	i. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ අනුබද්ධ ආයතනයක් විසින් ප්‍රදානය කළ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් (BAMS) හෝ සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් (BSMS) හෝ යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධියක් (BUMS) හෝ සිද්ධ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී ඩිප්ලෝමාවක් (DSAMS) හෝ සිද්ධ ආයුර්වේද ඩිප්ලෝමා සහතිකයක් (DSAC) ලබා තිබීම; *සහ* ii. ආයුර්වේද වෛද්‍ය සභාවේ වෛද්‍යවරයෙකු ලෙස ලියාපදිංචිය ලබා තිබීම හා ලියාපදිංචිය අලුත් කර තිබීම; සමග iii. අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම; *සහ* iv. රාජ්‍ය සේවයේ හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගත් වෙනත් සේවයක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද තිබිය යුතු ය.
වයස	- අවුරුදු 40 ට නොඅඩු හා 55 ට නොවැඩි අය විය යුතු ය.
වැටුප් පරිමාණය	- ක.සේ.චක්‍රලේඛ අංක 01/2025 අනුව HM 1-1 වැටුප් කේතය හිමි තනතුරකි. වැටුප් පරිමාණය රු. **140,640 - 15x4,100 – රු. 202,140** වේ. **2026.01.01 දිනට ආරම්භක වැටුප රු.123,019/- කි.** සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි.
බඳවා ගැනීමේ ක්‍රමවේදය	පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීමෙන් මෙම තනතුරට බඳවා ගනු ලැබේ. ඉහළම ලකුණු ලැබුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ. 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 19(1)(අ) සහ (2) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 49 (1) (අ) (2) සහ (3) වගන්ති යටතේ 2024.03.01 දින අංක 2373/43 යටතේ නිකුත් කර ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්* නිවේදනයේ රීති වලට යටත්විය යුතු ය. මෙය ආයුර්වේද වෛද්‍ය සභාව විසින් වර්ෂ තුනක කාලයක් සඳහා පත් කරනු ලබන බඳවා ගැනීමකි. (ධුර කාලය වසර තුනක් වන අතර දෙවන වාරයක් සඳහා නැවත පත් කරනු ලැබිය හැක.) උපරිම සේවා කාලය වසර 06 කි.

පත්වීම් බලධාරියා	ආයුර්වේද වෛද්‍ය සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය -
අයැදුම්කරන පිළිවෙල	**-** සියලුම ජීව දත්ත හා පළපුරුද්ද ඇතුළත් කොට මේ සමඟ අමුණා ඇති ආකෘතිය පරිදි තමා විසින්ම අයදුම්පත පිළියෙල කළ යුතු ය. ඉහතින් සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට පමණක් අදාළ අධ්‍යාපන සහතිකවල ජායා පිටපත් ද අයදුම්පත හා අමුණා එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ ඉහල වම්පස කෙලවරෙහි **"ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1) ලේඛකාධිකාරි බඳවා ගැනීම - ආයුර්වේද වෛද්‍ය සභාව"** ලෙස සඳහන් කොට **2026 ජුනි මස 26** දිනට හෝ ඊට පෙර **"සභාපති, ආයුර්වේද වෛද්‍ය සභාව, නාවින්න, මහරගම"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලබා දී ඇති උපදෙස් අනුව යොමු නොකරනු ලබන අයැදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර බඳවා ගැනීම පිළිබඳ අවසාන තීරණය ආයුර්වේද වෛද්‍ය සභාව සතුය.

ඒ.එම්.ජී.එන්. දීප්ති සුමනසේන,
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති,
ආයුර්වේද කොමසාරිස් ජනරාල්.

2026 මැයි මස 20 දින,
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී.